දිනය
திகதி
Date. 2025.06.20

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

ප්‍රියන්ත වීරසූරිය මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02.

**<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සම්බන්ධයෙනි</u>**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත දක්වා ඇති පරිදි මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කිරීමට කටයුතු කර ඇත.

1. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති පොලිස් නිළධාරීන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය
2. මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල සම්බන්ධයෙන් දැනුවත් කිරීම
3. පුද්ගලයන් පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලීසිය සමග සිදුවන ගැටුමකදී සිදුවන මරණ වළක්වා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය වෙත යොමු කරනු ලබන **2025** අංක **01** දරණ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ
4. මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම පිළිබඳ 2024 අංක 01 දරණ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ

මෙම මාර්ගෝපදේශ ආයතනික වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ විසින් පහත චක්‍රලේඛ මගින් ශ්‍රී ලංකා පොලීසිය දැනුම්වත් කිරීමට පියවර ගැනීම සම්බන්ධව කොමිෂන් සභාවේ ප්‍රසාදය පළකර සිටිමු.

1. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයින් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති පොලිස් නිළධාරීන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහන් කරන 2025.03.14 දිනැති චක්‍රලේඛය
2. මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල සම්බන්ධයෙන් දැනුවත් කිරීම චක්‍රලේඛ අංක **RTM-566 /CRTM-444**
3. පුද්ගලයන් පොලිස් අත්අඩංගුවේ පසුවන අවස්ථාවකදී හා පොලීසිය සමග සිදුවන ගැටුමකදී සිදුවන මරණ වළක්වා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති **2025** අංක **01** දරණ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ **RTM-567 /CRTM-446**



ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

4. මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති 2024 අංක 01 දරණ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ චක්‍රලේඛ අංක **RTM-568 /CRTM-447**

මෙම මාර්ගෝපදේශ සම්බන්ධයෙන් තවදුරටත් පොලිස් නිළධාරීන් දැනුම්වත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සුදුසු නිලධාරීන් මගින් සංවිධානය කරන ලෙසත්, ඒ සඳහා සම්පත් දායකත්වය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දීමේ හැකියාව පවතින බවත් කාරුණිකව දන්වා සිටිමි. මේ සම්බන්ධව 011-2505569 දුරකථන අංකයෙන් හෝ edudirector.hrcsl@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා, අධ්‍යක්ෂක-අධ්‍යාපන හා විශේෂ අධ්‍යාපන වැඩසටහන් වෙතින් අවශ්‍ය තොරතුරු ලබා ගත හැකිය.

මේ සඳහා ඔබ විසින් දක්වනු ලබන සහයෝගය අගය කරමි.

විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව